**ජා-ඇල ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 ව්‍යාවනය කළ මතය**

ජා-ඇල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය කිරීමේ පදනම කොටසේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

**1.2 ව්‍යාවනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ව්‍යාවනය කළ මතයක් පළකරනු ලැබේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන ආයතන සඳහා වන රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත පහදාදීම් හා මහපෙන්විම EG3.4 අනුව දේපල පිරියත උපකරණ ක්ෂය කිරීම් සඳහා ක්ෂය වෙන්කිරීම් ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | 2023 අවසන් ගිණුම ඉදිරිපත් කිරීමේදී නිවැරදිව ඉදිරිපත් කරන බව. | ප්‍රමිත අනුව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත පහදාදීම් හා මහ පෙන්වීම් අංක EG 4.17 පරිදි තොග සම්බන්ධ තොරතුරු ගිණුම්වල හෝ ගිණුම්වලට එන සටහන් තුළ හෙළිදරව් කර නොතිබුණි. | 2023 අවසන් ගිණුම ඉදිරිපත් කිරීමේදී නිවැරදිව ඉදිරිපත් කරන බව. | තොග සම්බන්ධ තොරතුරු ගිණුම්වල හෝ ගිණුම්වලට එන සටහන් තුල හෙළිදරව් කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ගිණුම්ගත කළ පෙර වර්ෂයේ මිලදී ගත් රු.866,000 ක් වූ යන්ත්‍රවලට අදාල රු.43,300 ක් වූ ක්ෂය ගිණුම් ගත කර නොතිබුණි. | 2023 අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී ජනල් මඟින් නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කෙටිකාලීන ආයෝජන සඳහා ලැබී තිබුණු රු.551,781 ක පොළී ආදායමක් හුවමාරු ගනුදෙනුවලින් වන අයභාරය යටතේ දක්වනු වෙනුවට ජංගම නොවන ආයෝජන ලෙස දක්වා තිබුණි. | 2023 අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී ජනල් මඟින් නිවැරදි කරන බව. | -එම- |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලෙජර් ගිණුම් 03 ක ශේෂ එකතුව සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන්ගේ එකතුව අතර රු.257,773,033ක වෙනසක් විය. | මෙම ශේෂය නිවැරදි කර ගැනීම සඳහා කමිටුවක් පත් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් හෝ උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පතු ගිණුමේ ශේෂය හා විස්තරාත්මක උපලේඛන සමඟ රු.4,876,351 ක නොසැසඳීමක් විය. | -එම- | -එම- |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශයේ 14 සටහනට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.74,734,401 ක් වූ තොග ශේෂයෙන් රු.73,485,826 කට උපලේඛන ඉදිරිපත්ව තිබුණි. එම උපලේඛන අනුව භෞතික තොගය රු. 8,332,280 ක් වූ අතර ඉතිරි රු. 65,156,216 තොග ගැලපුම් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.74,488,996 ක් වූ ගිණුම් ශේෂ 3 ක් ලේඛන හා උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මෙම ශේෂය නිවැරදි කර ගැනීම සඳහා කමිටුවක් පත් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | ලේඛන හා උපලේඛන ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලන රීති | | | |
| (i) | 48 රීතිය | සභාව සතු වැඩබිම් දෙකෙහි ගබඩා ද්‍රව්‍ය සම්බන්ධයෙන් තොග සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ඉදිරියේදී රීතිවලට අනුව විධිමත් පරිදි සිදුකරන බව. | යොමුගත රෙගුලාසියට අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 108(ඇ) | 2023 ජුලි 14 දිනට කල් පිරීමට නියමිත රු.110,551,781ක ආයෝජන වටිනාකම ජංගම වත්කම් යටතේ දක්වනු වෙනුවට ජංගම නොවන යටතේ දක්වා තිබුණි. | පිළිතුරු සපයා නොමැත | -එම- |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) | මු. රෙ. 371 | 2020, 2021 වර්ෂවලදී ලබාදි තිබූ රු.51,040ක අත්තිකාරම් ශේෂ 3 ක් පියවා නොතිබුණි. | මෙම අත්තිකාරම් පියවීම් සම්බන්ධව විස්තර ඉදිරියේදී විගණනයට ඉදිරිපත් කරමි. | යොමුගත රෙගුලාසියට අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | මු. රෙ. 571 | වර්ෂ 10 ක කාලයක් ඉක්ම වූ රු.68,272,520 ක තැන්පතු නියාදනය කර නොතිබුණි. | මෙම ශේෂය නිවැරදි කර ගැනීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර, ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.22,041,963 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.40,748,205 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කළ බැංකු සැසඳුමෙහි නිවැරදි කර ගත යුතු ශේෂය ලෙස රු.1,268,062 ක නොසැසඳීමක් විය. | දැනට මෙම ශේෂය නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බව. | ශේෂ හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

2.3 **ආදායම් පරිපාලනය**

2.3.1 **ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තුගත ආදායම රු. 000' | 2022 බිල් කළ ආදායම රු. 000' | 2022 රැස්කළ ආදායම රු. 000' | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. 000' | 2021 ඇස්තමේන්තුගත ආදායම රු. 000' | 2021 බිල් කළ ආදායම රු. 000' | 2021 රැස්කළ ආදායම රු. 000' | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. 000' |
|---|---|---|---|---|---|---|---|---|---|
| (i) | වරිපනම් හා බදු | 51,160 | 53,969 | 52,599 | 25,435 | 50,100 | 52,066 | 53,962 | 24,065 |
| (ii) | කුලී | 28,130 | 22,153 | 14,780 | 36,195 | 26,624 | 23,419 | 10,985 | 28,822 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,656 | 4,746 | 4,746 | 29 | 4,846 | 4,635 | 4,635 | 29 |
| (iv) | වෙනත් ආදායම් | - | - | 76,672 | - | - | - | 94,830 | - |
| | | 83, 946 | 80,868 | 148,797 | 61,659 | 81,570 | 80,120 | 164,412 | 52,916 |

2.3.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **කුලී**<br>ඉකුත් වර්ෂයේ අවසානයට සභාවේ හිඟහිටි කඩ කුලී රු.17,796,331ක් වුවද සමාලෝචිත වර්ෂයේ අවසානයට හිඟහිටි කඩ කුලී රු.27,556,741ක් විය. | වසර 20 කට පමණ පසු තක්සේරු කිරීමේදී රු.1,500.00 ට තිබූ කඩ කුලිය රු.17,500.00 දක්වා වැඩි වීම නිසා කඩහිමියන් සහන ඉල්ලමින් කඩ කුලී ගෙවීම් ප්‍රතික්ෂේප කිරීම නිසා ප්‍රතිශෝධන කටයුතු සඳහා තක්සේරු දෙපාර්තුමේන්තුවට යොමු කර ඇති බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජංගම වත්කම් යටතේ ලැබිය යුතු දෑ තුළ වසර 5 ඉක්ම වූ කාලයක සිට පැවත එන රු.29,015 ක කර්මාන්ත බදු හා රු.857,787 ක වෙනත් හිඟ ආදායම් ද පෙර වර්ෂවල සිට නිරවුල් කිරීමකින් තොරව ඉදිරියට ගෙන එනු ලබන ශේෂ 6 කින් සමන්විත රු.5,415,955 ක ගිණුම් ශේෂයක් ද අයකර ගැනීමකින් තොරව නොවෙනස්ව ඉදිරියට ගෙන එමින් පැවතිණි. | මෙම ශේෂය නිවැරදි කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ජංගම වගකීම් යටතේ ගෙවියයුතු දෑ තුළ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ සිට අවිනිශ්චිත ගිණුම නමින් වූ රු.236,425 ක ශේෂය ද, රු.91,797,395ක ණයහිමි ශේෂයක්ද, 2020 හා 2021 වර්ෂවලින් ඉදිරියට ගෙන එන ලද රු. 4,129,122 ක් වූ පොදු සැපයුම් ණයහිමි ශේෂයක්ද නිරවුල් කර නොතිබුණි. | අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිවැරදි කිරීමට පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමුකර ඇත. ඉතිරි ශේෂයන් නිරවුල් කර නිවැරදි කර ඉදිරියේදි ඉදිරිපත් කරන බව. | -එම- |
| (ඇ) | 2022 පෙබරවාරි 03 දින අලුත්වැඩියාවක් සඳහා ආයතනයක් වෙත භාරදී තිබූ මෝටර් රථය විගණිත දින වන 2023 මාර්තු 16 දින දක්වාම අලුත්වැඩියා කර සභාවට භාරදී නොතිබුණි. | වාහනය අළුත්වැඩියා කිරිමට අදාල ඇස්තමේන්තු ඉදිරිපත් කර ඇති බැවින් අනුමැතිය ලද පසු ගෙවීම් කිරීම සඳහා ණයහිමි වෙන්කිරීම් සිදු කර ඇති බව | මෝටර්රථය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව පවත්වාගෙන යනු ලබන ස්ථාවර වත්කම් වන ඉඩම් හා ගොඩනැගිලි 31ක හිමිකම් නිරවුල් කරගෙන ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි. | විගණනයෙන් පෙන්වාදී ඇති ගොඩනැගිලි 44 න් 13 ක් මේ වන විට නිවැරදි කර ඇත. ඉතිරිය නිවැරදි කිරීමේ කටයුතු කරන බව. | සියළු ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමීක්ෂණ මණ්ඩලය විසින් හඳුනා ගෙන නොතිබුණු සභාව සතුව පැවති බිම් කොටස් 02ක් නිවැරදිව හඳුනා ගැනීම සම්බන්ධව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ වනවිට මෙම දේපල වලින් 06 ක් හඳුනාගෙන ලේඛන නිවැරදි කර ඇත. ඉතිරි දේපල 02 කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සභාව සතු දේපල හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාවේ වත්කම් ලේඛනයේ සටහන් කර තිබුණු ක්‍රීඩා පිටි 16ක්, සුසාන භූමි 17ක්, ප්‍රජා ශාලා 13ක් , නාන ලිං 51ක් හා ඉඩම් 36ක් යන දේපල ඔප්පුවක් හෝ පිඹුරක් මඟින් සනාථ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම දේපල සමීක්ෂණය තුලින් ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ලේඛන නිවැරදිව යාවත්කාලීන කළ යුතුය. |
| (ඈ) | ස්ථාවර වත්කමක් ලෙස ගිණුම්වල දක්වා තිබුණු දැනට වර්ෂ කීපයක සිට අක්‍රියව පැවති මිට්ෂුබිසි ඩබල් කැබ් රථය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මිලගණන් කැඳවීමේදී කිසිදු ආයතනයකින් මිලගණන් නොවූ බැවින් නැවත මිලගණන් කැඳවීමට තීරණය කර ඇත.ඒ අනුව ඉදිරියේදී ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බව. | ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුකූලව අළුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 2020 දෙසැම්බර් 22 දිනැති අංක LGD/GM/1/7/පොදු/2020 දරන ලිපිය ප්‍රකාර පරිගණක මෘදුකාංග මිලදීගැනීමේදී විධිමත් ප්‍රසම්පාදන ක්‍රියා පරිපාටියක් අනුගමනය කළ යුතු බව අවධාරණය කර තිබුණද කාර්යාල කටයුතු පරිගණක ගත කිරීමේ අරමුණින් සුදුසු ලංසුකරුවෙකු තෝරාගැනීම සඳහා කිසිදු අධ්‍යයනයකින් හා සොයා බැලීමකින් තොරව මාර්ගෝපදේශවලට පටහැනි අවස්ථා දෙකකදී එකතුව රු.10,030,000 ක් වූ වරිපනම් කළමනාකරණය, මිශ්‍ර ආදායම් කළමනාකරණය,ගිණුම් කළමනාකරණය හා තොග හා ගබඩා කළමනාකරණය සම්බන්ධයෙන් පරිගණක මෘදුකාංග පද්ධති මිල දී ගෙන තිබුණි. | මේ සඳහා සීමිත තරගකාරී මිලගණන් කැඳවීම සභාවේ අනුමැතිය ලබාගෙන සිදුකරන ලදි. තවද වර්තමානයේදී නෙක්ෆා මෘදුකාංග පද්ධතිය මගින් වරිපනම්, මිශ්‍ර ආදායම්, ගිණුම්, තොග හා ගබඩා කළමනාකරණය යන විෂය ක්ෂේත්‍ර සාර්ථකව ක්‍රියාත්මකව පවතින බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව මිලදී ගැනීම් සිදුකළ යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | සේවක ණය<br>------------- | | |
| I | 2020 අගෝස්තු 24 දිනැති අංක LGD/09/2019/(I) දරන පළාත් පාලන චක්‍රලේඛය ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ''බී'' ගිණුමෙහි ආකෘති ප්‍රකාර සීමා අනුමත කරගෙන නොතිබුණි. | 2023 වර්ෂයේදී අත්තිකාරම් සීමා අනුමත කරගෙන ඇති බව. | සීමා හඳුනාගෙන අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| II | සේවක ණය ශේෂයට අදාල උපලේඛන, සේවක ණයලේඛන ශේෂ සමඟ අණාවරණය වූ රු.186,200 ක වෙනස සම්බන්ධයෙන් පරීක්ෂා කර නිවැරදි කර නොතිබුණි. | මේ පිළිබඳව නැවත පරීක්ෂාවක් සිදුකර නිවැරදි කිරීමට කටයුතු කර විගණනයට ඉදිරිපත් කරන බව. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| III | අයකරගත නොහැකි සේවක ණය වශයෙන් රු.291,799 ක ණය ශේෂයක් පෙර වර්ෂයේ සිට ඉදිරියට ගෙනවිත් තිබූ නමුත් ඒ සඳහා විස්තරාත්මක උපලේඛනයක් ඉදිරිපත් කර නොතිබුණි. | මෙම ශේෂයද ඇතුළුව ගිණුම් 07 ක් නිවැරදි කර ගැනිමේ වැඩසටහන යටතේ වාර්තා සකස් කිරීමට කමිටුවක් පත්කර ඇත. කමිටු වාර්තාව අනුව ඉදිරියේදී මෙම ශේෂ නිවැරදි කරගැනීමට කටයුතු කරන බව. | විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |